# ආණ්ඩුවේ නිවේදන

## 2004 අංක 11 දරණ මුදල් පනත

2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් 2010 අංක 01 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝගවලට 2010.12.01 දින සිට බලපවත්වන පරිදි සිදු කරනු ලබන සංශෝධන.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය**

2010.නොවැම්බර් මස වැනි දින
කොළඹ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේදීය.

**නියෝග**

1. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 4 වැනි නියෝගයට පසුව නියෝග 4 (අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

   "4 (අ) විශේෂිත දුරකථන අංක සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් වන බද්ද 1 වැනි උපලේඛනයේ අ (i) වගුවෙහි දක්වා ඇති පරිදි අදාළ අනුප්‍රමාණවලින් හා අදාළ කාල පරිච්ඡේද සඳහා අයකළ යුතුය".

2. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 5 වැනි නියෝගයට පසුව නියෝග 5 (අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

   "5 (අ) නියෝග 4 (අ) යටතේ එන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් අය කරන ලද හා එකතු කරන ලද බද්ද කොමිසම විසින් බෙදාහරිනු ලබන්නේ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව සම්බන්ධයෙන් පමණි. සෑම වර්ෂයකම විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ලෙස හර කරන ප්‍රමාණය 1 වැනි උපලේඛණයේ වගුව 'ආ (i)' හි දක්වා ඇති අනුප්‍රමාණ අනුව විය යුතුය".

3. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 7 වැනි නියෝගයට පසුව නියෝග 7 (අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

"7 (අ) 1 වන උපලේඛණයේ 'අ(i)' වගුවට අනුව එකතු කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව සියයට පනහක් (50 % ) නියෝග 11 හි දක්වා ඇති පරිදි කොමිසන් සභාව විසින් ප්‍රසිද්ධ කර ඇති නියමිත දිනයේ සිට දින 15 ක් ඉක්මයාමට මත්තෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය".

4. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 08 වැනි නියෝගයට පසුව නියෝග 8 (අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

"8 (අ) පළමු උපලේඛණයේ 'අ (i)' වගුව යටතේ එක් රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වෙන් ඉතිරි සියයට පනහක (50%) අරමුදල් සහ ඒ මත උපයන පොළිය කොමිෂන් සභාව සුදුසු යැයි තීරණය කරනු ලබන ආකාරයට සේවා ලබාගැනීම සහ ඒ සඳහා ප්‍රවේශවීමේ රටේ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා භාවිතා කිරීම හෝ බෙදාහැරීම කළ හැකිය".

5. නියෝග 9 පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

යන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් වූ (මෙහි මින්මතු යන දේශීය ප්‍රවේශ ගාස්තු (ය. දේ. ප්‍ර. ගා) යනුවෙන් සඳහන් කරනු ලබන) බද්ද මේ නියෝගවල 1 උපලේඛණයේ වගුව ආ (i) හි දක්වා ඇති කාලසීමාව සඳහා සහ එවැනි අනුප්‍රමාණ අනුව විය යුතුය.

6. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 9 වන නියෝගයට පසුව නව නියෝග 9 (අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නියෝග ඇතුළත් කෙරේ.

"9 (අ) පළමු උපලේඛණයේ වගුව ආ (i) යටතේ එක්රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව නියෝග 11 දක්වා ඇති පරිදි ප්‍රසිද්ධ කරන ලද නියමිත දිනයෙන් දින 15 ඉක්මයාමට මත්තෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය".

7 ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 9 (අ) වැනි නියෝගයට පසුව නියෝග 9 (ආ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නියෝග ඇතුළත් කෙරේ.

“9 (ආ) පළමු උපලේඛණයේ වගුව ආ (i) යටතේ එක් රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන් ඉතිරි සියයට පනහක (50%) අරමුදල් හා ඒ මත උපයන පොළිය කොමිෂන් සභාව සුදුසු යැයි තීරණය කරනු ලබන ආකාරයට සේවා ලබාගැනීම සහ ඒ සඳහා ප්‍රවේශවීමේ රටේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා භාවිතා කිරීම හෝ බෙදාහැරීම කළ හැකිය”.

8. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 2 උපලේඛණයේ හුවමාරු ඇමතුම් වගුවට පසුව බලාත්මක වන පරිදි පහත සඳහන් වගු ඇතුළත් කෙරේ.

**විශේෂිත අංක හුවමාරු සම්බන්ධතා**

| **ඇමතුම් අවසාන වූ ජාලයේ ක්‍රියාකරු** | **සම්බන්ධ වූ මුළු විශේෂිත දුරකථන අංක** | **සම්පූර්ණ පිරිවැයුම් මිනිත්තු ගණන** |
|---|---|---|
| අ ක්‍රියාකරු | | |
| ආ ක්‍රියාකරු | | |

| **ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු (ජා.වි. සං.ක්‍රි.)** | **සම්බන්ධ වූ මුළු විශේෂිත දුරකථන අංක** | **සම්පූර්ණ පිරිවැයුම් මිනිත්තු ගණන** |
|---|---|---|
| අ ක්‍රියාකරු | | |
| ආ ක්‍රියාකරු | | |

## උපලේඛණ 1

වගුව අ (i)

එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුපාත

| **වර්ෂය** | **කාලසීමාව** | **එක් දුරකථන අංකයක් සඳහා අයකිරීම් ඇ.ඩො.** | **මිනිත්තු 1500 ඉක්මවූ විට ගාස්තුව ඇ. ඩො. ශත** |
|---|---|---|---|
| 2010 | 30.11.2010 - 31.12.2010 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1 |
| 2011 | 01.01.2011 - 31.12.2011 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1 |
| 2012 | 01.01.2012 - 31.12.2012 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1 |

වගුව ආ (i)

යන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු අනුප්‍රමාණ

| **වර්ෂය** | **කාලසීමාව** | **එක් මිනිත්තුවක් සඳහා අයකිරීම් ශ්‍රී ලංකා රුපියල්** |
|---|---|---|
| 2010 | 01.12.2010 - 31.12.2010 | 2.00 |
| 2011 | 01.01.2011 - 31.12.2011 | 2.00 |
| 2012 | 01.01.2012 - 31.12.2012 | 2.00 |